# 16. ආබ්‍රහම්

බොහෝ කාලයකට පෙර ඌර් නම් රටේ ආබ්‍රහම් කියලා මිනිසකු සිටියා. එයාගේ බිරිඳගේ නම සාරා. මේ දෙන්නා සමඟියෙන් ජීවත් වුණා. දෙන්නා ම දෙවි පියාට හරි ම ආදරෙන් හිටියා. මේ දෙදෙනා මහලු වුණත් දරුවන් සිටියේ නෑ.

දවසක් දෙවි පියා ආබ්‍රහම්ට කතා කර, ඔහුගේ දේපොළ නෑදෑයන්, අත්හැර හාරාන් දේශයට යාමට කතා කළා. ආබ්‍රහම් ද දෙවි පියාට කීකරු වී හාරාන් දේශයට ගියා.

දවසක් දෙවි පියා ආබ්‍රහම්ට කතා කර සාරාට පුතෙක් ලැබෙන බව කිවුවා. ආබ්‍රහම්ට පුදුම හිතුණත්, දෙවි පියා කී වචන විශ්වාස කළා. අන්තිමේ දී සාරාට පුතෙක් ලැබුණා.



ආබ්‍රහම් ඒ දරුවාට ඊසාක් කියා නම් තැබුවා. ආබ්‍රහම් සහ සාරා ඊසාක් පුතා හොඳින් රැක බලා ගත්තා.

දෙවි පියා නැවතත් දවසක් ආබ්‍රහම්ට කතා කර ඊසාක් පුතාව එතුමාණන්ට තෑගි වශයෙන් ඔප්පු කරන්න කියා පැවසුවා. ආබ්‍රහම්ට දුක හිතුණා.

එහෙත් පුතාව අයිති දෙවි පියාට බවත්,
දෙවි පියාගේ වචනවලට කීකරු විය යුතු බවත්,
ඔහු කල්පනා කළා.

ඊසාක් පුතාව දෙවි පියාට ඔප්පු කිරීමට
ආබ්‍රහම් තීරණය කළා. ඊසාක්ව දර සෑය මත තිබ්බා.
පුරාණ සිරිතට අනුව තම පුතාව යාගයක් ලෙස
ඔප්පු කිරීමට සැරසුණා.

ආබ්‍රහම්ගේ විශ්වාසය ගැන
දෙවිපියා හරි සතුටට පත් වුණා.

දෙවිපියා ආබ්‍රහම්ට කතා කොට මෙසේ කීවා.
''ආබ්‍රහම්, ඔබේ දරුවා හොඳින් රැක බලා ගන්න. ඔබගේ විශ්වාසය ගැන මා හරි ම සතුටුයි''

ආබ්‍රහම් සහ සාරා දෙවි පියාට ස්තුති කර ඊසාක් පුතා
ආදරයෙන් හදා වඩා ගත්තා.

ආබ්‍රහම් වාගේ අපිත් දෙවි පියාගේ වචනවලට කීකරු වෙමු.
දෙවි පියා විශ්වාස කරමු.

පැවරුම්

පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

1. ඊසාක්ගේ දෙමවුපියන් කවු ද ?
2. ආබ්‍රහම් ජීවත් වූයේ කුමන රටේ ද ?
3. හාරාන් දේශයට යාමට ආබ්‍රහම්ට අණ කළේ කවුද ?
4. සාරාට පුතකු ලැබෙන බව දෙවි පියා පැවසූ විට ආබ්‍රහම් කුමක් කළේ ද ?